සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සිංහල භාෂා අංශය

සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023

(පාසල් මට්ටම)

## පද්‍ය නිර්මාණය හා අවබෝධය

**12/13 ශ්‍රේණිය** **කාලය පැ.01 මි.30යි.**

I කොටසට අයත් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

II කොටසේ (අ), (ආ) කොටස් දෙකෙන් එක කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

පහත දැක්වෙන ඡේද කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. (අ) කවියෙකු කවියක් රචනා කිරීමෙන් අපේක්ෂා කරන්නේ කිසියම් අපූරු අත්දැකීමක් සූචනය කොට පාඨකයා තුළ චමත්කාරයක් දැනවීමය. කවියක අන්තර්ගත අත්දැකීම් විවිධාකාර විය හැකිය. ඇතැම් විට මුල, මැද, අග යන අංග ත්‍රයයෙන් යුක්ත වූ කථා ප්‍රවෘත්තියක් පදනම් වන්නට පුළුවන. ගුත්තිලය, කාව්‍යශේඛරය, සුදෝ සුදු, ගුරුළු වත වැනි කෘතිවල දක්නට ලැබෙන්නේ මේ ගණයේ අත්දැකීම්ය. ඇතැම් කවියක අත්දැකීමට කිසිදු කතා පුවතක් මුල් නොවන්නට ඉඩ ඇත. ගුණදාස අමරසේකරයන්ගේ උඳුවප් ඇවිල්ලා නමැති පද්‍යාවලියෙහි දක්නට ලැබෙන්නේ ද එබන්දකි. උඳුවප් සමය උදා වී ඇත්තේය. තුරු ලිය කුසුමින් වැසී ගොස්ය. හාත්පස පරිසරයෙහි අමුතු ජීවයක් ඇත්තා සේය. එම පරිසරය කවියා තුළ සරාග හැඟීම් දනවයි. රාගික හැඟීමෙන් ප්‍රමුදිත කවියා අවට ලෝකයේ පිළිබිඹු වන සෞන්දර්යය විචිත්‍රාකාරයෙන් දක්වයි. තවත් සමහර විටෙක කවියක අත්දැකීම් විචාර චින්තාවක් ඇසුරෙන් සකස් වූවක් විය හැකිය. සිරි ගුණසිංහ විසින් රචනා කරන ලද මරනය නොසැලී හිමාලයක් මෙන් යන්න ඊට නිදර්ශනයකි. මෙම මුළු කවියට ම එය මූලාශ්‍රය වී ඇත. මරණය යනු අන් කිසිවක් නොව කාලය බවයි. ජීවිතය යනු ක්‍රියාවන් සමූහයකි. ඒ ඒ ක්‍රියාවන් සඳහා ගත වන කාලයත් සමග මරණය තව ළං වේ. එම නිසා ජීවත්වීම යනු මරණයට තව තවත් ළං වීමයි. එසේම කිසියම් කාව්‍ය රචනයකට හුදු හැඟීම් මාත්‍රයක් පමණක් මූලාශ්‍රය විය හැකිය. එකී හැඟීම එදිනෙදා ලෝකයෙහි ක්‍රියාත්මක ව පවත්නා නියාම ධර්මයනට අනුකූල වූවක් හෝ අද්භූත වූ එකක් වීමට ද ඉඩ ඇත.

i. කවියක් රචනා කිරීමෙන් කවියා අපේක්ෂා කරන්නේ කුමක්ද?

ii. කථා ප්‍රවෘත්තියක් මුල් වන කවි පන්තියකට නිදසුන් දෙකක් ලියන්න.

iii. උඳුවප් ඇවිල්ලා නමැති පද්‍යාවලියෙහි දක්නට ලැබෙන්නේ කෙබඳු අත්දැකීමක් ද?

vi. 'විචාර චින්තාවක්' අත්දැකීම වූ කවි පන්තියකට නිදසුනක් ලියන්න.

v. උක්ත ඡේදයේ සඳහන් වන ආකාරයට කවියක අන්තර්ගත විවිධාකාර අත්දැකීම් මොනවා ද?

(ලකුණු 05යි)

02. පද පූරණය කරන්න.

1. රන් කිරි කට ගෑ දෙතොලේ

සුවඳ තාම දැනෙයි මලේ

මත් පෙති කුඩුවලට ලොලේ

.................................................................................

2. අන්න අන්න ...................... සෙනඟ ඇදෙන්නේ

ගම පුරා ම සිනා කිකිනි හඬ රැව්දෙන්නේ

............................................ සතුට පිරෙන්නේ

.................................................... සමරන්නේ (ලකුණු 10යි)

03. පහත දැක්වෙන පැදි පෙළ පිළිබඳ ඇගයීමක් කරන්න.

බියපත් වූ ආකාසය මේ කුළු පිටුපස සැඟවෙ යි

නයි පොළොංගු වාගේ ගන'ඳුර අප සිරුරේ එල්ලෙ යි

දෙදරවමින් මිහි මඬලම ගොරතර හෙණ හඬ පැතිරෙ යි

ලේ තැවරුණු කගපත ඇති විදුලිය පැන පැන දුව ය යි

තැතිගත් ඇයගේ දෑසින් බිය හෙම්හිට ගලා බසි යි

දැඩි ලෙස කැලඹී ඇති ඇගෙ සිඟිති මුහුණ මැලවී ය යි

යුහුව මවෙත දිව අවුදින් මා ඇකයේ හිස සඟව යි

අවට ලොවින් බේරා ගන්නා ලෙස ගොළු බසින් යදි යි

බිය නොවන්න දියණිය ඔබ සිටිනු මැනවි නොවී සස ල

තෙදියත නතු කළ සක්විති රජ කෙනෙක්මි යුතු තෙද බල

දුටු සඳ මා, ගනකුළු විදුලිය හා හෙණ හඬ ද පුව ල

බැගෑපත්ව වැතිරෙනු ඇත දුවැවිත් මා දෙපා අස ල

නාගල කන්දෙන් හෙණ හඬ නැඟී අහස දෙදරන වි ට

දිවගොස් මම එකල වැලඳ ගතිමි තාත්තා හනික ට

ඔහුගේ ඇකයේ උණුසුම දැනුදු දැනෙනවා මාහ ට

මේ සති අන්තයෙ කෙලෙසින් හෝ මා යා යුතුය ගම ට (ලකුණු 15යි)

04. පහත දැක්වෙන කවි පදවලට අදාළ විරිතෙන් ම පිළිතුරු කවිය ලියන්න.

ඇති හැකිවුන්ගෙ පමණක් බඩ පිරිලා නම්

අසරණ එවුන් කුසගින්නේ මිය යත්නම්

සාධාරණ මිලට බඩු කඩයේ නැත්නම්

දුප්පත් මිනිසුන්ට ඇයි කරදර මෙතරම්

මාපියන් සොඳිනේ

වැඩපල කරයි තුටිනේ

සහයට නො ගොසිනේ

ඉඳුම හොඳ නෑ නේද පුතුනේ (ලකුණු 10යි)

05. පහත දැක්වෙන චිත්‍රය නිරීක්ෂණය කර ඔබගේ සිතේ මැවෙන සංකල්ප පද්‍ය 05කට නොඅඩු වන සේ නිර්මාණය කරන්න.



(ලකුණු 20යි)

## II කොටස

පහත දැක්වෙන (අ) කොටසින් එකක් හෝ (ආ) කොටසේ කොටස් දෙකෙන් එක කොටසක් හෝ තෝරාගෙන පද්‍ය 05කට නොඅඩු වන සේ පද්‍ය රචනාවක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) 1. වේවැල් කෝටු නාරන් සියඹලා අතු

කිතුල් පොල් ඉරටු වැල් කහඹිලිය අතු

මේ හැම ඉපල් මගෙ දැතට නො පෑ යුතු

පමා නොවී එම් අකුරට මෙයින් මතු

2. උඩගු ලියන් ගොතා බඳින

නීල වරල සරසන්නට

මා පිපුණේ නැත

මේ දෙරණේ

01. (ආ)ඔබේ ගෙවත්තේ එළවලු, පලතුරු, තැඹිලි, පොල් යනාදියට හානි කරන රිළා රංචු දුටු විට ඔබට ඇති වන සිතුවිලි කවියකට නගන්න.

නැතහොත්

ඔබත් සමග මෙවර පොසොන් උත්සවය සැමරීමට පැමිණෙන ලෙස ලොකු අම්මාට අමතන කවි ලිපියක් ලියන්න. (ලකුණු 40යි)